3 වන පිටෙන්

මිනිස් සවිඥානකත්වයේ වර්ධනය සහ දියුණුව ද, ආගම මගින් මොට කරනු ලැබේ. ඒ, ප්‍රබන්ධිත් යථාර්ථයකී මිනිසුන් මතට ඉහළින් පැටවීමෙනි. විශ්වය පිළිබඳවත්, ජීවිතයේ අර්ථය පිළිබඳවත් අපගේ ස්වාධීන ඥානනයකට ඉඩ නොතබමින්, සමස්ත දේවධර්මයක් හෝ පාරභෞතිකවාදයක් අප මතට පටවනු ලැබේ. එවිට අප කරන්නේ, සිතීම නතර කිරීමයි. බැටළු රැලක් වන්නැ යි අපට කියාදෙයි. බයිබලය, කුරානය සහ ටෝරා පනත් අනුගමනය කරන්නැ යි ඉල්ලා සිටී.

බුද්ධාගම සම්බන්ධයෙන් ඇත්තේ වෙනස් තත්වයකි. බුදුරජාණන් වහන්සේම චින්තනයේ නිදහසට අනුබල දුන්නේය. තමා කියන නිසාවත්, වෙනත් විශ්වාස කලහැකි පුද්ගලයන් කියන නිසාවත්, සම්ප්‍රදායයෙන් එන නිසාවත්, පොතපතේ තියෙන නිසාවත් යමක් පිළිනොගන්නැ යි කී උන්වහන්සේ, රන්කරුවෙකු ගින්නෙන් රත්රන් පිරික්සන්නා සේ තමාගේ ධර්මයත් පිරික්සා බලා පිළිගන්නැ යි කීහ. (කාලාම සූත්‍රය). කෙසේ වෙතත්, ස්ථාපිත බෞද්ධ ධූරාවලිය මේ සා නිදහසක් ප්‍රදානය කරන්නේ නැත. බුද්ධාගම පිළිබඳ අසම්මත අර්ථකථනයක් වූ බවතරණය ලිවීම නිසා එල්ල වූ අනේක අපවාද හේතුවෙන් මාර්ටින් වික්‍රමසිංහ මියගියේ බෙහෙවින් කලකිරුණු පුද්ගලයෙකු වශයෙනි.
මං ක්‍රිස්තියානි මං මුස්ලිම්, මං හින්දු මං බෞද්ධ ආදී වශයෙන් මිනිස්සු තමන්ව හඳුන්වා ගනිති. එවැනි අනන්‍යතාවක් පවරා ගැනීමෙන් තමන් කරන්නේ යථාර්ථය පිළිබඳ එක් ස්ථාපිත පර්යාලෝකයකට කල්තියාම තමන්ව කොටු කර ගැනීමකැ යි කෙනෙකුට නොවැටහෙන්නේ මන්ද? එයින් සිදුවන්නේ, කෙනෙකුගේ මනස විවෘතව තබා ගැනීම දුෂ්කර වීම හේතුවෙන් වෙනත් පර්යාලෝක සසඳා බැලීමටවත්, ස්වාධීන සවිඥානක මනුෂ්‍යයෙකු වශයෙන් නිදහස් විනිශ්චයකට පැමිණීමටවත් නොහැකි වීම ය. නිදහස්, බුද්ධිමත් ජීවියෙකුගේ දැක්ම, විලංගුවලට යට නොවෙයි. ශුද්ධ වූ පොතක් හෝ එවැනි පොතක් අර්ථකථනය කරන්නන්ගෙන් හෝ ඔහුගේ දැක්මට විලංගු නොවැටෙයි. සත්‍යය පිළිබඳ එවැනි බාහිර සම්පාදකයෙකු මත යැපීම නියාලු පුද්ගලයෙකුට පහසුවක් විය හැකි වෙතත්, විචාරශීලී මනසකට එවැන්නක් මායිම් නොවෙයි.

යථාර්ථය අවබෝධ කර ගැනීමට මිනිසුන්ට හැකි වන්නේ විද්‍යාවෙන්ම පමණි. එහෙත් ස්වකීය ආගමික විශ්වාස දැදුරු කරන විද්‍යාඥයන්ගේ නව සොයා ගැනීම් ප්‍රතික්ෂේප කිරීමට දේවධර්මාචාර්යවරු අසාර්ථක උත්සාහයක් ගෙන ඇත. විශ්වයට අදාළ ප්‍රස්තුත හෝ නිගමන මුළුමණින්ම අයත් වන්නේ විද්‍යාවේ පරිපථයටයි. දේවධර්මවාදය දැනුමේ මූලාශ්‍රයක් නොව, දැනුමේ මූලාශ්‍රය වන්නේ විද්‍යාවමයි. උදාහරණයක් වශයෙන්, දෙවියන් වහන්සේ පවතී ද යන ප්‍රශ්නය සාක්ෂි මත විමසා බැලීම අයත් වන්නේ විද්‍යාවට ය. එය, විශ්වය පිළිබඳත්, විශ්වය තුළ අපට හිමි ස්ථානය පිළිබඳවත් දියාරු ආකාරයකිනි. මළ මිනිසුන්ට මරණයෙන් නැගී සිටිය හැකි බව හෝ ගර්භාෂයෙන් ගර්භාෂයට, මිනිස් ආත්ම භවයකින් ගොළුබෙලි ආත්ම භවයකට සහ නැවත මිනිස් ආත්ම භවයකට ආදී වශයෙන් සංසාරයේ සැරිසැරිය හැකි බව අපට කියාදෙනු ලැබේ. මේ අනුව, අන්ත ප්‍රබන්ධ කතා විශ්වාස කිරීමට අනුගාමිකයාට බල කෙරේ. අනර්ථයකින් තොර සම්භෝගය සඳහා කාමයේ යෙදීම අපට තහනම් කෙරේ. අනවශ්‍ය දරු ගැබ් පාලනය කිරීම සහ ලෙඩ රෝගවලින් වැළකීම සඳහා උපත් පාලන කොපු පාවිච්චි කිරීම තහනම් කෙරේ. ලැයිස්තුව තවත් බොහෝ දිග ය. ජීවිතාරක්ෂාව සඳහා මෙපමණකින් නතර වීම යෙහෙකි.

## *ශ්‍රී ලංකාවේ අපේ උප්පැන්න සහතිකවල, ලිංගිකත්වය සහ ජාතිය සඳහන් වන්නා සේ ආගම ද සඳහන් වෙයි. ආගම වැනි විශ්වාස පද්ධතියක්, පුද්ගලයෙකුගේ නිත්‍ය අනන්‍යතා සළකුණක් විය හැක්කේ කෙසේ ද?*

අප සතු දැනුමට අදාළ වන වැදගත් ප්‍රශ්නයකි. බුද්ධාගමේ සහ හින්දු ආගමේ කියැවෙන පුනරුත්පත්තියත් එවැනි තවත් වැදගත් ප්‍රශ්නයකි. එවැනි අනුභූතික ක්ෂේත්‍ර පිළිබඳ අපගේ දැනුම සොයා යාම ආගමකට බාර කළ යුතු නැත.

අද අපට තියෙන ආගම් මිනිසුන් අතරේ ස්ථාපිතව ඇත්තේ විද්‍යාලෝකය බිහි වීමට පෙර කාලයක ය. විද්‍යාත්මක චින්තනයක් සහ විද්‍යාත්මක ක්‍රමවේදයක් නොපැවතුණු කාලයේ, අපට යථාර්ථය අවබෝධ කර ගැනීම සඳහා සහාය වීම පැවරී තිබුණේ දේවධර්මාචාර්යවරුන්ට ය. එහිදී ඔවුහු විශ්වාස කළ නොහැකි පල්හෑලි ගොන්නක් දෙසාබෑහ. ඒ අනුව, පෘථුවියේ වයස අවුරුදු 10,000 කැයි අපට කියාදෙනු ලැබුණි. මුළු විශ්වයම දෙවියන් වහන්සේ විසින් දින හතක දී මැවූ බව කියාදෙනු ලැබුණි. විශ්වයේ කේන්ද්‍රය පෘථුවිය යැයි කාලාන්තරයක් තිස්සේ කියාදෙන ලදි. එය එසේ නොවේ යැයි සොයාගත් කොපර්නිකස්ට, තමා දරුණු බොරුවක් කී බව ප්‍රසිද්ධියේ පිළිගන්නට බල කරන ලදි. අද පවා, ජීව විද්‍යාත්මක පරිණාමය ඉගැන්වීම සමහර ඇමරිකානු පාසල්වල තහනම් කොට ඇත. චාර්ල්ස් ඩාවින් තම නව මං හෙළි කළ සොයාගැනීම් ප්‍රකාශයට පත්කිරීමට මොන තරම් බිය වීද යත්, ඔහු එය ප්‍රසිද්ධියට පත්කිරීම පමා කළා පමණක් නොව, අවසානයේ දී එය ලෝකයාට ඉදිරිපත් කෙළේ ද

සෑම ආගමකම පොදු හුයක් වන්නේ, අප මුහුණදෙන වර්තමාන යථාර්ථය අතෘප්තිමත් සහ මායාකාරී බවටත්, ඒ නිසා අවසාන සහනයක් වෙනුවෙන් කැපවිය යුතු බවටත් වන විශ්වාසයකි. ඒ අර්ථයෙන් ගත් විට, ආගම් යනු මරණය පිළිබඳව ගොඩනැගෙන ආධානග්‍රාහී ලබ්ධීන් ය. මේ මතු භවය පිළිබඳ විශ්වාසය නිසා සැබෑ ආගමිකයා කරන්නේ, අප දන්නා එකම ජීවිතය වන වර්තමාන සැබෑ දිවියේ සැපතින් සහ අසිරියෙන් ඉවත් වීමයි. ජීවිතයෙන් එසේ ඉවත් වීම වෙනුවට, අපේ මිනිස් සගයන් වෙනුවෙන් සුන්දර වූ අසරණ සරණයේ නොයෙදෙන්නේ ඇයි? එය, වඩාත් එලදායී හෝ අවම කුහකත්වයෙන් යුක්ත නොවන්නේ ද?

අපෙන් බොහොමයක් දෙනාට ආගමක් ලැබෙන්නේ උත්පත්තියේ දීම දෙමාපියන් විසින් ආගමක් පටවන නිසා ය. කිතුණුවෝ එසේ හෞතීස්ම කෙරෙත්. දරුවෙකු ක්‍රිස්තියානි, මුස්ලිම් හෝ බෞද්ධ වශයෙන් සැළකීම ඇත්තෙන්ම අයෝග්‍ය ය. මන්ද යත්, එවැනි අනන්‍යතාවක් ගැන දරුවා සවිඥානක නැති බැවිනි. එහෙත් ශ්‍රී ලංකාවේ අපේ උප්පැන්න සහතිකවල, ලිංගිකත්වය සහ ජාතිය සඳහන් වන්නා සේ ආගම ද සඳහන්

26 වන පිටට

## සන්නස Cartoon by PK




**PK ගේ කාටුන් රසවිඳින්නට දිනපතා www.sannasa.net අඩවියට ගොඩවන්න**

